4

# ඊමානයට හානි පමුණුවන කරුණු

إِنَّ اللهَ لَا يَغْفِرُ أَنْ يُّشْرَكَ بِهٖ وَيَغْفِرُ مَا دُوْنَ ذٰلِكَ لِمَنْ يَّشَآءُ

**නියත වශයෙන් ම අල්ලාහ් ඔහුට කිසිවක් ආදේශ කිරීමට (ෂිර්ක්) සමාව නොදෙන්නේ ය. ඔහුට අභිමත වූ අයට (ෂිර්ක් හැර) අන් දෙයට සමාව දෙන්නේ ය. (4 අන්නිසා : 48)**

මුස්ලිම්වරයකු ඊමානය ශ්‍රේෂ්ඨ දයාදයක් ලෙස සිතන්නේ ය; ඔහුගේ ජීවිතය එම දයාදය මත පදනම් කරගෙන සකස් කර ගන්නේ ය. එම දයාදය රැක ගැනීමට ඔහු ඕනෑ ම දෙයක් අහිමි කර ගැනීමට හෝ කැප කිරීමට වුව ද පසුබට නොවේ.

මුස්ලිම්වරයෙකු තුළ තිබෙන මෙම විශිෂ්ට වූ ඊමානය රැක ගැනීමට නම්, එයට හානි පමුණුවන කරුණු පිළිබඳ දැනුමක් ඔහු සතු විට යුතු ය. ඒ අනුව ඊමානයට හානි පමුණුවන කරුණු කිහිපයක් පිළිබඳ පහත පහදා දෙනු ලබන්නේ ය.

1. ඉල්හාද්
2. කුෆ්ර්
3. ෂිර්ක්
4. රිද්දත්

## ඉල්හාද්

ඉල්හාද් යන පදයෙන් අදහස් වන්නේ, දේවවාදයක් හෝ කිසි දු ආගමික විශ්වාසයක් හෝ නොමැති තත්ත්වයකි. එයට අදාළ වන්නේ කිසි දු ආගමක් ධර්මයක් නැති පිරිස් ය.

එවැනි ජනයා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාගේ කාලයේ ද සිටි බවට අල් කුර්ආනය සාක්කි දරයි."ඇත්තේ මෙලොව ජීවිතය පමණි. අපි මිය යන්නෙමු. කාලය මිස වෙනත් කිසිවක් අපව විනාශ නොකරන්නේ ය. මෙලෙස ඔවුහු පවසති. මේ ගැන අනුමානය විනා ඔවුන්ට නිශ්චිත නිසි දැනුමක් නැත." (45අල් ජාසියා :24)

දෙවියන් හා පරමාන්ත දිනය ප්‍රතික්ෂේප කරන ජනතාව එම සමාජය තුළ ජීවත් වූ බව මෙම වැකියෙන් වටහා ගත හැකි ය.

ආගමක් දහමක් නොඇදහීම මිනිස් ස්වභාවයට විරුද්ධ වූවකි. ලොවේ සෑම කාලවකවානුවක ම වූ ජනයා කිසියම් ධර්මයක් දහමක් පිළිපදිමින් ජීවත් වූහ. "මානව ඉතිහාසයේ නියමිත දහමක් නොඅදහන සමාජයක් නොසිටි තරම් ය." ඓතිහාසික සත්‍ය මඟින් දේව වාදී ආගමික විශ්වාස සමග මිනිසා ජීවත් වීම, මිනිස් ස්වභාවය යන්න තහවුරු කරයි.

ආගමක් දහමක් නොඇදහීම මිනිස් ස්වභාවයට පමණක් නොව විචාර බුද්ධියට ද එරෙහි වූවකි. ආගමික විශ්වාස පිළිගෙන ජීවත් වන ජනතාවගේ තර්ක හා සාක්ෂි හමුවේ ඔවුහු අසීරුතාවට පත් වෙති.

මිනිස් සමූහය බිය ගන්වන ආගමක් දහමක් නොඅදහන නරුමවාදී ස්වරූපයෙන් ලොව රැක ගැනීම, මිනිස් සමූහය විගසින් ඉටු කළ යුතු අනිවාර්ය වගකීමකි.

### කුෆ්ර්

භාෂාමය වශයෙන් 'කුෆ්ර්' යන පදය සැඟවීම, වැසීම යන අර්ථයෙන් භාවිත කරනු ලැබේ. ඉස්ලාමීය දැක්මට අනුව ඉස්ලාමීය විශ්වාස හා නිශ්චිත වශයෙන් දැනුම් දෙන ලද ක්‍රියාකාරකම් ප්‍රතික්ෂේප කිරීම දැක්වීමට මෙම පදය භාවිත කරනු ලැබේ.

## කුෆ්ර් ඇති වීම මාර්ග 3කට ගොනු කළ හැකි ය.

**1. විශ්වාසය හා සම්බන්ධ :-**

අල්ලාහ් විශ්වාස නොකිරීම, නබිවරු විශ්වාස නොකිරීම, ස්වර්ගය - නිරය විශ්වාස නොකිරීම, සලාතය වගකීමකි යන්න විශ්වාස නොකිරීම යනාදිය මීට උදාහරණ කිහිපයකි.

**2. වචනය හා සම්බන්ධය :-**

අල්ලාහ්ට බැණ වැදීම, නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට බැණ වැදීම, ආගමික වගකීම්වලට විහිළු කිරීම යනාදිය මීට උදාහරණ කිහිපයකි.

**3. ක්‍රියා හා සම්බන්ධ :-**

අවමන් කිරීමේ අරමුණින් අල් කුර්ආනය ඉරා දැමීම, නැතහොත් එය කසල බඳුනට දැමීම, පිළිම වන්දනා කිරීම යනාදිය මීට උදාහරණ කිහිපයකි.

කුෆ්ර්හි අවදානම වටහා ගැනීමට උදාහරණ ලෙස අල් කුර්ආන් වැකි දෙකක් ඉදිරිපත් කරන්නෙමු.

"ප්‍රතික්ෂේප කරන්නන් ද තව ද ප්‍රතික්ෂේප කරන්නන් ලෙස ම මියගිය අය ද සකල මහපොළෝතලය ම රනින් වසා ගැලවීමක් සඳහා වන්දියක් වශයෙන් එය ඉදිරිපත්කොට සිටිය ද නියත වශයෙන් ම (ඔවුන්ගෙන් කිසිවකුගෙන්) කිසිවිටෙක නොපිළිගනු ඇත. ඔවුනට (පරලොව දී) නින්දිත දඬුවම් ඇත. තව ද ඔවුනට පිහිට වන කිසිවකු ද නැත." (3 ආල ඉම්රාන් :91)

"කවුරුන් දෙවියන් ප්‍රතික්ෂේප කරන්නන් වූවෝ ද ඔවුන්ගේ ක්‍රියාවන් කාන්තාරයෙහි ඇති වන්නා වූ මිරිඟුවට සමාන වන්නේ ය. පිපාසයට පත් වූවන් එය ජලය යැයි, සිතා එයට ළඟා වූ විට ඔවුන් කිසිවක් නොදකින්නෝ ය. නමුත් එතැන් දී ඔවුන් අල්ලාහ්වම දකින්නෝ ය. අල්ලාහ් ඔහුගේ ගණනය කිරීම නිමා කරන්නේ ය. (එනම් ඔහුව මරනයට පත් කරන්නේ ය) අල්ලාහ් ප්‍රශ්න කිරීමේ හී ඉතාමත් තීව්‍ර වන්නේ ය." (24 අන්නූර් :39)

යහ ක්‍රියා සඳහා වන යහපත වළක්වා සදාකාලික නිරය වෙත අප කැන්දන් යන කුෆ්රයෙන් නිරතුරුව ම කල්පනාකාරි ව සිට සාර්ථක ජීවිතයකට මං පාදා ගනිමු.

## ෂිර්ක්

භාෂාමය වශයෙන් සමාන කිරීම, එක්රුස් කිරීම යන අර්ථයෙන් මෙම පදය භාවිත කරනු ලැබේ. ඉස්ලාමීය දැක්මට අනුව "අල්ලාහ්ගේ දේවත්වයට හැර කිසිවකුට හෝ කිසියම් ශක්තියකට හිමිකමක් ඇත" යන්න විශ්වාස කිරීම හෝ එවැනි විශ්වාස පිළිඹිබු වන පරිදි කිසියම් ක්‍රියාවක් සිදු කිරීම ෂිර්ක් යනුවෙන් හඳුන්වනු ලැබේ.

## ෂිර්ක් ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වනු ලැබේ.

**ෂිර්කුල් අක්බර් (මහා ෂිර්ක්) :**

අල්ලාහ් වෙනුවෙන් ම පමණක් ඉටු කළ යුතු වතාවත් හා නැමදුම් අල්ලාහ් හැර වෙනත් කෙනකු උදෙසා ඉටු කිරීම ෂිර්කුල් අක්බර් යනුවෙන් හඳුන්වනු ලැබේ. නැමදීම, ප්‍රාර්ථනා කිරීම, භාර වීම, බිලි දීම යනාදිය මීට උදාහරණ ලෙස සඳහන් කළ හැකි ය. මහා ෂිර්ක්හි නියැළෙන්නකුගේ යහක්‍රියා ඔහුට ප්‍රයෝජනයක් ගෙන නොදේ.

"තවුබා නොකර සමාවක් නොලැබෙන එක ම පව ෂිර්ක් ය."

"ඇත්තෙන් ම අල්ලාහ් තමන්ට කිසිවක් සමාන කිරීම සඳහා සමාව නොදෙයි. මේ හැර ඕනෑම දෙයකට අභිමත පරිදි සමාව දෙයි."(4 අන් නිසා 48)

**ෂිර්කුල් අස්කර් (කුඩා ෂර්ක්) :**

පාපික්‍රියා අතරින් මහ ෂිර්ක්වලට අනතුරුව දෙවන ස්ථානය දරන්නේ කුඩා ෂිර්ක් වේ. ඒ නිසා මෙය මහා පාප කර්ම සේ ම අයහපත් යන්න ය, ප්‍රතික්ෂේප කළ නොහැකි ය. අල්ලාහ් කෙරෙහි අසත්‍ය සිදු කිරීම, වශී කිරීම, සාස්තර බැලීම යනාදිය මීට උදහරණ කිහිපයකි.

අල්ලාහ්ට කැලලක් ඇති කරන ෂිර්ක්වලින් වැළකී සිටීම ස්වරගයට පිවිසෙන්නන්ට ම කියා ආවේණික වූ ගුණාංගයක් ලෙස දක්නට ලැබේ.

## රිද්දත්

භාෂාමය වශයෙන් 'රිද්දත්' යන පදය පරණ තත්ත්වයට හැරීම, නැවත හැරීම, පසුබට වී යෑම යන අර්ථයෙන් භාවිත කරනු ලැබේ. ඉස්ලාමීය දැක්මට අනුව මුස්ලිම්වරයකු තමන් කාෆිර්වරයකු බවට පත් කරවන වචන උච්චාරණය කිරීම මගින් හෝ ක්‍රියාවක් කිරීම මගින් ඉස්ලාමය හැර ඉවත් ව යාම දැක්වීමට මෙම පදය භාවිත කරනු ලැබේ. කෙටියෙන් පවසනවා නම්, මුස්ලිම්වරයකු ආගම වෙනස් කිරීම 'රිද්දත්' ලෙස හැඳින් වේ. මෙලෙස ආගම වෙනස් කරගත් තැනත්තා 'මුර්තද්' ලෙස හඳුන්වනු ලබයි.

මුස්ලිම් සමාජය මුර්තද්වරයකු සමග වන සබඳතාව සහමුලින් ම බිඳ දමති. ඔහුගේ බිරිඳ ඔහු අතහැර වෙන් වී යයි. ඔහුගේ දේපළ උරුමක්කරුවන්ට ලබා නොදෙනු ඇත. ඔහු ඥාතීන්ගෙන් උරුම වන දේපළ ලබා ගැනීමට සුදුස්සෙකු නොවේ. තව්බා නොකළ තත්ත්වයේ දී ඔහු මිය ගියේ නම් ඔහු වෙනුවෙන් සලාතය ඉටු කරනු නොලැබේ. මුස්ලිම් සුසාන භූමියක ඔහු වළලනු නොලැබේ. මුස්ලිම් සමාජය ඔහු 'ධර්මද්‍රෝහියකු' ලෙස සලකනු ලබයි.

මිනිසාගේ දෙලොවෙහි ම ජයග්‍රහණයට පිවිතුරු ඊමානය අනිවාර්ය දෙයකි. සිතෙහි අල්ලාහ් පිළිබඳ ඇති වන සැක සහිත දේ පවා ඊමානයට තර්ජනයක් වේ යන්න අවධාරණය කර ගත යුතු ය. මුස්ලිම්වරු වශයෙන් අප ඉඛ්ලාස් වන ඊමාන් සමග ජීවිතය සකස් කරගෙන අල්ලාහ්ගේ තෘප්තිය ලබා ගැනීම තම ජීවිතයේ අරමුණ කර ගත යුතු ය.

**පාඩමේ ඇතුළත් වැදගත් අරාබි වචන**

❁ الإِلْحَادُ ❁ الكُفْرُ ❁ الشِرْكُ ❁ الرِدَّةُ ❁ الشِّرْكُ الأَكْبَرُ ❁ الشِّرْكُ الأَصْغَرُ

**අභ්‍යාසය**

1. ඊමානයට බලපෑම් එල්ල කරන කාරණා හතරක් සඳහන් කරන්න.
2. 'ෂිර්ක්හි' වර්ග උදාහරණ සහිත ව පැහැදිලි කරන්න.
3. 'කුෆ්ර්' යනු කුමක් ද, එහි වර්ග මොනවා ද?
4. 'මුර්තද්' යනු කවරෙක් ද, තවුබා කර පාපයෙන් මිදීම නොවුණ හොත් ඔහුට අත් වන ඉරණම කුමක් ද?
5. ඉල්හාද් යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න .